# 03 බහු සංස්කෘතික ජන සමාජය

## හැඳින්වීම

එක් රටක් තුළ විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන සහ විවිධ ජනවර්ගවලට අයත් පුද්ගලයන් ජීවත් විය හැකි ය. එවැනි කණ්ඩායම්වලින් සමන්විත සමාජ බහු සංස්කෘතික සමාජ (Multicultural Society) ලෙස හැඳින්වෙයි.

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන්,

- බහු සංස්කෘතික සමාජ ඇති වීමට හේතු වී ඇති කරුණු
- බහු සංස්කෘතික සමාජයක පුරවැසියකු වශයෙන් කටයුතු කිරීමේ දී ප්‍රගුණ කළ යුතු ගුණාංග
- එම ගුණාංග ප්‍රගුණ කිරීමෙන් ගැටුම් අවම සාමකාමී සමාජයක් ගොඩනගා ගන්නා ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

නාමල්යාය මහා විද්‍යාලයේ 8 ශ්‍රේණියේ සිසුන් අතර පුරවැසි අධ්‍යාපනය කාල පරිච්ඡේදයේ දී ඇති වූ සංවාදයක කොටසක් පහත දක්වේ. එය හොඳින් කියවා අවබෝධ කර ගන්න.

| | | |
|---|---|---|
| ජනුද | : | අපි ජීවත් වන, අඳින පලඳින, හැසිරෙන ආකාරය නේද, සංස්කෘතිය කියන්නේ ? |
| දෙව්නි | : | ඒ විතරක් නෙමෙයි, සංස්කෘතිය කියන්නේ. අපි කතාබස් කරන ආකාරය, ආහාර අනුභව කරන ආකාරය ආදි සෑම ක්‍රියාවක් ම ඊට අයත්. අතීතයේ සිට අපේ මුතුන් මිත්තන් ගොඩනඟා ඇති සෑම අංගෝපාංගයක් ම සංස්කෘතියට අයිතියි. |
| වෙනෙතු | : | මොනවා ද ඒ අංගෝපාංග කියන්නේ ? |
| ෆාතිමා | : | වෙහෙර විහාර, කලා නිර්මාණ, වැව්, අමුණු, කෝවිල්, පල්ලි වගේ සංස්කෘතික අංග තමයි ඒ අංගෝපාංග කියන්නේ. ඇයි ඔයාට මතක නැද්ද අපි 7 පන්තියේ දී ඉගෙන ගත්තා? |
| අන්සාර් | : | හොඳයි, අපි දන් සංස්කෘතිය පිළිබඳව නිර්වචනයක් හදමු. |
| දේවි | : | සංස්කෘතිය කියන්නෙ ජීවත් වන, අඳින පලඳින, හැසිරෙන, කතාබස් කරන, ආහාර අනුභව කරන, වැඳුම් පිදුම් කරන ආදි සෑම ක්‍රියාවකටමයි. ඊට අමතරව කලා ශිල්ප සහ සිරිත් විරිත් ආදි සියල්ලටත් සංස්කෘතිය කියලා කියනවා. |
| දෙව්නි | : | අපේ සෑම ක්‍රියාවක් පිටුපස ම සිට අපිව හසුරවන උපකරණය සංස්කෘතියයි. |
| දේවි | : | අපි දැනුම්වත්ව හෝ නොදැනුම්වත්ව සංස්කෘතිය අපව මෙහෙයවනවා නේද? |
| අන්සාර් | : | අප සියලු දෙනාට ම සංස්කෘතියක් තිබෙනවා. ඒක ප්‍රදේශයෙන් ප්‍රදේශයට, සමාජයෙන් සමාජයට, ආගමෙන් ආගමට, ජනවර්ගයෙන් ජනවර්ගයට වෙනස් වෙන්න පුළුවන්. නමුත් සංස්කෘතිය මිහි මත ජීවත් වන සෑම පුද්ගලයෙකුට ම තිබෙන දෙයක්. |
| ගුරුතුමිය | : | සංස්කෘතිය ගැන මගේ පන්තියෙ දරුවො දන්න දේවල් ගැන මට පුදුම සතුටක් ඇති වෙන්නෙ. ඇත්තට ම දන් ඔය දරුවො කතා කළ දේවල් අහන කොට අලුතින් උගන්වන්න දෙයක් නැති තරම් මට. |

## සංස්කෘතිය (Culture)

පුද්ගලයකු උපන් දා සිට මිය යන මොහොත දක්වා ම හැසිරෙන්නේ තම සංස්කෘතියට අනුකූලවයි. එම නිසා ඕනෑ ම සමාජයක් මෙහෙයවන ප්‍රධාන බලවේගය වන්නේ සංස්කෘතියයි. සංස්කෘතියෙන් තොරව කිසි දු පුද්ගලයකුට හුදෙකලා වී සිටිය නොහැකි ය. "සංස්කෘතිය" යන වචනය සමාජ හා මානව විද්‍යාඥයන් විවිධ අයුරින් නිර්වචනය කර තිබේ. පහත දක්වෙන්නේ සංස්කෘතිය පිළිබඳව ඉදිරිපත්ව ඇති නිර්වචන දෙකකි.

“සමාජයේ සාමාජිකයකු වශයෙන් මිනිසා විසින් අයත් කර ගන්නා වූත්, ලබා ගන්නා වූත්, දැනුම, විශ්වාස, කලා, සදාචාර දහම් හා වෙනත් හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය වේ.”

ඊ. බී. ටයිලර් - (ප්‍රාථමික සංස්කෘතිය)

“සංස්කෘතිය යනු කිසියම් ස්ථානයක වෙසෙන ජනකායකගේ සාමූහික ජීවන ක්‍රමයයි. ඔවුන්ගේ සිරිත්විරිත්, ගති පැවතුම්, ආචාර විචාර, සමාජ සංස්ථා, කලාව හා ආගම තුළින් සංස්කෘතිය ප්‍රකට වෙයි”.

මහාචාර්ය විමල් දිසානායක - (විවාදාත්මක ලිපි)

ඉහත නිර්වචන සහ 8 ශ්‍රේණියේ සිසුන් අතර ඇති වූ සංවාදය ඇසුරින් ගොඩනගන ලද සරල නිර්වචනයක් පහත දැක්වේ.

**“මිනිසා විසින් අයත් කර ගෙන ඇත්තා වූ දැනුම, විශ්වාස, කලා, සිරිත්විරිත්, ජීවනෝපාය ආදී සියල්ල සංස්කෘතියයි.”**



**සංස්කෘතියට අයත් අංග කිහිපයක්**

## බහු සංස්කෘතිය (Multiculture)

| | | |
|---|---|---|
| ෆාතිමා | : | බහු සංස්කෘතිය කියන්නෙ මොකද්ද ජනුද? |
| ජනුද | : | එක ම රටක් තුළ විවිධ ජන වර්ග ජීවත් වන, විවිධ ආගම් අදහන, විවිධ භාෂා කතා කරන, විවිධ සිරිත්විරිත් අනුගමනය කරනු ලබන මිනිසුන්ගෙන් සමන්විත සමාජයකට බහු සංස්කෘතික සමාජයක් කියලයි කියන්නෙ. |
| දෙව්නි | : | මම කියන්න ද, පුංචි නිදසුනක්? ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් වැනි ජන කණ්ඩායම් ජීවත් වෙනවා. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි හා කතෝලික ආගම් අදහන අය වගේ ම සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා කතා කරන අයත් ඉන්නවා. එම නිසා අපේ රට බහු සංස්කෘතික සමාජයක් වගේ ම බහු සංස්කෘතික රටක්. |
| අන්සාර් | : | ඔව්. ඔව්. එම වෙනස්කම් සංස්කෘතික විවිධත්වය කියලා හැඳින්වෙනවා. |
| දේවි | : | ඒත් එම කණ්ඩායම්වල සංස්කෘතිය අතර වෙනස්කම් තියෙනවා නේද? ඒ වගේ ම ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව වැනි රටවල් බෙහොමයක් බහු සංස්කෘතික සමාජ සහිත රටවල්. ඒ රටවල විවිධ ජන වර්ග වගේ ම ආගම් හා භාෂා කතා කරන කණ්ඩායම් රාශියක් ඉන්නවා. |

වර්තමාන ලෝකයේ රටවල් බොහොමයක් බහු සංස්කෘතික සමාජ ලෙස හැඳින්විය හැකි ය. එවැනි සමාජ තුළ ජීවත් වන සෑම පුරවැසියකු ම අන්‍යෝන්‍ය විශ්වාසයෙන් හා සාමූහිකත්වයෙන් කටයුතු කළ යුතු ය.

බහු සංස්කෘතික සමාජ පවතින රටවලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

**ශ්‍රී ලංකාව**

**ඉන්දියාව**

**ඇමෙරිකා එක්සත් ජනපදය**

**බ්‍රිතාන්‍යය**

## 3.1 ක්‍රියාකාරකම

- සංස්කෘතිය පිළිබඳව ඔබ උගත් කරුණු ඇසුරින් සරල නිර්වචනයක් ගොඩ නගන්න. එම නිර්වචනය පිළිබඳව පන්තියේ අනෙක් සිසුන් සමග සාකච්ඡා කරන්න.

## බහු සංස්කෘතික ජන සමාජය (Multicultural Society)



විවිධ සංස්කෘතික ලක්ෂණවලින් හෙබි ප්‍රජාව වාසය කරන සමාජ, බහු සංස්කෘතික සමාජ වේ. එවැනි සමාජ තුළ සියලු වාර්ගිකයන්, ආගමිකයන්, මෙන් ම විවිධ භාෂා කතා කරන සහ විවිධ සිරිත්විරිත් අනුගමනය කරන සැම දෙනා ම එක්ව කටයුතු කළ යුතු ය. එමගින් ගැටුම් අවම වේ; සාමූහිකත්වය වර්ධනය වේ; තිරසර සාමයක් ගොඩනැගෙයි; රට සංවර්ධනය වේ.



වර්තමාන සෑම සමාජයක් ම බහු සංස්කෘතික සමාජ වන නිසා එවැනි සමාජයක ජීවත් වීමේ දී අප විසින් අනුගමනය කළ යුතු ගුණාංග රැසකි. විශ්වීය පුරවැසියෙකු වශයෙන් ඔබෙන් අපේක්ෂා කරන්නේ එවැනි සමාජ ක්‍රමයක් තුළ එම ගුණාංග ප්‍රගුණ කරමින් කටයුතු කිරීම වේ. පහත දක්වෙන්නේ එවැනි ගුණාංග කිහිපයකි.

- සෑම ජනවර්ගයකට ම අයත් පුද්ගලයන්ට ගරු කිරීම
- සෑම ජනවර්ගයකට ම අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- කිසි දු ජනවර්ගයක්, ආගමික කණ්ඩායමක් උසස් හෝ පහත් හෝ කොට නොසැලකීම
- සෑම ආගමක ම, හා ජනවර්ගයක ම සංස්කෘතික ම උරුම ආරක්ෂා කිරීම හා ඒවාට ගරු කිරීම
- අන් අයගේ මතවාද, අදහස් ඉදිරිපත් කිරීමට ඇති අයිතිය පිළිගැනීම හා ඒවාට ඇහුම්කන් දීම
- තම යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම

### බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ

විවිධ භාෂා කතා කරන, විවිධ ජනවර්ග හා විවිධ ආගමික කණ්ඩායම් වෙසෙන, විවිධ සිරිත්විරිත් අනුගමනය කරනු ලබන සමාජයක් බහු සංස්කෘතික සමාජයක් ලෙස හඳුන්වන බව ඔබ දැන් තේරුම් ගෙන ඇත. ඒ අනුව තව දුරටත් එම බහු සංස්කෘතික ලක්ෂණ වෙන් වෙන්ව හඳුනා ගැනීමට මෙමගින් ඔබට අවස්ථාව උදා වේ.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 1. විවිධ ජනවර්ග ජීවත් වීම

බහු සංස්කෘතික සමාජයක් තුළ විවිධ ජනවර්ග ජීවත් වේ. එම ජනවර්ග සාමකාමීව, සාමූහිකව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. එය බහු සංස්කෘතික සමාජයක පැවැත්මට අත්‍යවශ්‍ය වේ. වාර්ගික අනන්‍යතාවට වඩා එකම ජාතියක් ලෙස තම රට ගැන සිතා කටයුතු කළ යුතු ය. අප රටේ බහුතරයක් වූ සිංහල ජනතාව, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදි ජන වර්ග සමඟ සාමූහිකව ජීවත් වෙති. මේ සියලු දෙනා “ශ්‍රී ලාංකිකයන්” වශයෙන් සිතා මතා කටයුතු කිරීම නිදසුනක් ලෙස පෙන්වා දිය හැකි ය.



විවිධ ජනවර්ග

## 2. විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජීවත් වීම

බහු සංස්කෘතික සමාජයක පවතින තවත් අංග ලක්ෂණයක් නම් විවිධ ආගම් අදහන ජන කොටස් ජීවත් වීමයි. තම ආගම මෙන් ම අනෙක් ආගම් කෙරෙහි ද ගරු කිරීම, එම ආගමික මතවාද හෙළා නොදැකීම, අපේ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා එම ආගම්වලින් සුදුසු උපදෙස් ලබා ගැනීම බහු සංස්කෘතික සමාජයක පැවැත්මට අතිශය වැදගත් වේ. සෑම ආගමක් අතර ම සහජීවනයක් පවත්වාගෙන යාමට අප සියලු දෙනා අධිෂ්ඨාන කර ගත යුතු ය.



විවිධ ආගමික ස්ථානවල වන්දනා කරන බැතිමතුන්

## 3. විවිධ භාෂා කතා කරන ජන කොටස් ජීවත් වීම

විවිධ භාෂා කතා කරන ජන කොටස් සිටීම බහු සංස්කෘතික ජන සමාජයක තවත් ලක්ෂණයක් වේ. තම භාෂාව පමණක් නොව වෙනත් භාෂා ද ඉගෙන ගැනීම, අදහස් හුවමාරු කර ගැනීමට එම භාෂා යොදා ගැනීම, සෑම භාෂාවක් ම සම තත්වයෙහිලා සැලකීම බහු සංස්කෘතික සමාජයක යහපැවැත්මට උපකාරී වේ.




**විවිධ භාෂාවන්ට අයත් අක්ෂර කිහිපයක්**

## 4. විවිධ සිරිත්විරිත් දක්නට ලැබීම

විවිධ සිරිත්විරිත්, සම්ප්‍රදායයන් බහු සංස්කෘතික සමාජයක දැකිය හැකි ය. එම සිරිත්විරිත්, සම්ප්‍රදායයන් අනාගත පරපුර වෙත පවරා දෙන්නේ සංස්කෘතියයි. එක ම ජන සමාජයක් තුළ විවිධ සිරිත්විරිත්, සම්ප්‍රදායයන් පැවතිය හැකි ය. ඒවාට ගරු කිරීම, හෙළා නොදැකීම, ආරක්ෂා කිරීම, තම ජීවිතයට අදාළ කර ගත හැකි දෑ උකහා ගැනීම ඉතා වැදගත් ය.



**විවිධ සිරිත්විරිත්**

## 5. විවිධ සංස්කෘතික උරුම පැවතීම

සෑම සංස්කෘතියකට ම උරුම වූ සංස්කෘතික අංග පවතී. සංස්කෘතික උරුම සංස්කෘතියේ අනන්‍යතාව පෙන්වන කැඩපතකි. නිදසුන් ලෙස බෞද්ධ සංස්කෘතික උරුම ලෙස දාගැබ්, වෙහෙර විහාර පෙන්වා දිය හැකි ය. සංස්කෘතික අංග ආරක්ෂා කර පවත්වා ගෙන යාමෙන් සංස්කෘතියේ ප්‍රෞඪත්වය, අභිමානය ප්‍රදර්ශනය වේ. එම උරුම රැක ගැනීම, ඒවාට ගරු කිරීම බහු සංස්කෘතික සමාජයක යහපැවැත්මට හේතු වේ.



විවිධ සංස්කෘතික උරුම

## ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය

ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටකි. අප රටේ විවිධ ජනවර්ග, ආගමික කණ්ඩායම් මෙන් ම විවිධ භාෂා කතා කරන ජන කොටස් ජීවත් වෙති.

පහත දැක්වෙන්නේ අප රටේ ජනවර්ග හා ආගම් අනුව ජනගහනය බෙදී ඇති අයුරු දැක්වෙන වගු සටහනකි.

| ජනවර්ගය | ජනගහනය | ප්‍රතිශතය | ආගම | ජනගහනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| සිංහල | 15,250,081 | 74.9 | බෞද්ධ | 14,272,056 | 70.1 |
| ශ්‍රී ලංකා දෙමළ | 2,269,266 | 11.2 | හින්දු | 2,561,299, | 12.6 |
| ශ්‍රී ලංකා යෝනක | 1,892,638 | 9.3 | ඉස්ලාම් | 1,967,523 | 9.7 |
| ඉන්දියානු දෙමළ | 839,504 | 4.1 | කතෝලික/ක්‍රිස්තියානි | 1,552,161 | 7.6 |
| බර්ගර් | 38,293 | 0.2 | | | |
| වෙනත් | 106,836 | 0.3 | | | |

මූලාශ්‍රය : ජන සංගණනය (2012), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

නාමල්යාය මහා විද්‍යාලයේ 08 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය විෂයභාර ගුරුතුමිය ඉහත වගු සටහන හොඳින් නිරීක්ෂණය කිරීමට සිසුන්ට උපදෙස් දුන් අතර කාර්යය පත්‍රිකාවක් ද ලබා දුන්නාය.

> - **ශ්‍රී ලංකාවේ ජීවත් වන ජන කණ්ඩායම්**
> - **ශ්‍රී ලංකාවේ ජීවත් වන ආගමික කණ්ඩායම්**

එම කාර්ය පත්‍රිකාවට අදාළව සිසුන් අතර ඇති වූ සංවාදයක් පහත දැක්වේ.

අන්සාර් :- අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ ජන වර්ග ජීවත් වනවා.

නර්මදා :- ඒ විතරක් නොවෙයි. වෙනත් බොහෝ රටවල අයත් අප රටේ ජීවත් වනවා.

වෙනෙතු :- බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික සහ ක්‍රිස්තියානි ආගමික කණ්ඩායම් ජීවත් වනවා.

අන්සාර් :- ඔව්. ඒක ඇත්ත. ඒ වගේ ම වෙනත් විවිධ ආගම් අදහන අයත් ඉන්න පුළුවන්.

දෙව්නි :- සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා කතා කරන අය ඉන්නවා.

අන්සාර් :- ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු ආගමික, බහු භාෂා කතා කරන ජන කණ්ඩායම්වලින් යුක්ත රටක්. එම නිසා බහු සංස්කෘතික රටක්.

නර්මදා :- ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය භාෂා, ආගම්, සිරිත්විරිත්, සංස්කෘතික උරුම ඇසුරින් විස්තර කරන්න පුළුවන්.

වෙනෙතු :- මේ වගුව අනුව මට තව අදහසක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ තමයි එක ජනවර්ගයකට අයත් පුද්ගලයන් වෙනත් ආගම් අදහන්න පුළුවන්. නිදසුන් ලෙස සිංහල අය කතෝලික/ ක්‍රිස්තියානි ආගම් අදහන්න පුළුවන්; දෙමළ අය හින්දු ආගම වගේ ම බුද්ධාගම අදහන්නත් පුළුවන්.

## 3.2 ක්‍රියාකාරකම

- ශ්‍රී ලංකාවේ සෑම වාර්ගික හා ආගමික කණ්ඩායම් විසින් ම පොදුවේ වැඳුම්පිදුම් කරනු ලබන ස්ථාන කිහිපයක් නම් කරන්න.
- බහු සංස්කෘතික සමාජයක පුරවැසියකු වශයෙන් කටයුතු කිරීමේ දී අපෙන් ඉටු විය යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න.

## විවිධ සංස්කෘතික සම්ප්‍රදායන්, සිරිත්විරිත් හා උත්සව

බහු සංස්කෘතික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතීන් පවතී. එම සංස්කෘතීන් හා බැඳුණු සංස්කෘතික ස්ථාන රාශියක් වේ. නිදසුන් ලෙස දළදා මාලිගය, ජය ශ්‍රී මහා බෝධිය, කතරගම දේවාලය, ත්‍රිකුණාමලයේ කෝනේෂ්වරම් කෝවිල, නල්ලූර් කෝවිල, මඩු පල්ලිය, දවටගහ මුස්ලිම් පල්ලිය ආදිය ඒ අතර ප්‍රධාන වේ. ඊට අමතරව විවිධ සංස්කෘතීන්ට අයත් ආගමික උත්සව, විවාහ මංගල චාරිත්‍ර ආදිය සංස්කෘතික අංගවලට නිදසුන් වෙයි.

## විවිධ ජන වර්ග හා බැඳුණු සිරිත් විරිත්

බහු සංස්කෘතික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් යන ප්‍රධාන ජනවර්ග තුන ජීවත් වේ. එම ජනවර්ග තුන හා බැඳුණු විවිධ සිරිත්විරිත් රාශියක් පවතී. දරුවකු මව් කුස පිළිසිඳ ගත් දා සිට වයසට ගොස් මිය යාම දක්වා මෙන් ම මියයාමෙන් පසු ඔහු වෙනුවෙන් සිදු කරනු ලබන සෑම ක්‍රියාවක් ම සංස්කෘතිය හා බැඳුණු සිරිත්විරිත් වේ.

**සිරිත් යනු අප විසින් සිදු කරනු ලබන චාරිත්‍ර වේ. විරිත් යනු අප විසින් නොකළ යුතු දේවල් වේ. නැතිනම් අත්හළ යුතු දේවල් ය.**

## විවිධ ආගම් හා බැඳුණු සිරිත්විරිත්, සම්ප්‍රදායන්, උත්සව හා ඒවායේ වැදගත්කම

බහු සංස්කෘතික රටක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් හතරක් පවතී. එනම් බෞද්ධ, හින්දු, කතෝලික/ක්‍රිස්තියානි, ඉස්ලාම් ය. එම ආගම් හා බැඳුණු සිරිත්විරිත්, සම්ප්‍රදායන් මෙන් ම විවිධ උත්සව ද පවතී.


ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන් හැඩගැසී ඇත්තේ ආගම මුල් කරගෙනයි. එම සංස්කෘතීන්ට අයත් සිරිත්විරිත් හා උත්සව බෙහොමයක් ආගමික අරමුණු මුල් කර ගෙන ගොඩනගා තිබේ. පහත දැක්වෙන්නේ අප රටේ ආගම පදනම් කොටගෙන ගොඩනැගී ඇති සංස්කෘතීන් ය.

- බෞද්ධ සංස්කෘතිය
- හින්දු සංස්කෘතිය
- ක්‍රිස්තියානි/ කතෝලික සංස්කෘතිය
- ඉස්ලාම් සංස්කෘතිය

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## බෞද්ධ සංස්කෘතිය (Buddhist Culture)





වෙසක්/ පොසොන් උත්සව

බෞද්ධයෝ තම ජීවිතය යහපත්ව ගොඩ නගා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් යොදා ගනිති. බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළින් යහපත් ජීවන ක්‍රමයක් මෙන් ම ආධ්‍යාත්මික විමුක්තියක් ද ලබා ගැනීමට මග හෙළි කෙරේ. පංච ශීලය ගිහියාගේ නිත්‍ය ශීලය වේ. බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහි කරමින් උදේ සවස වැඳුම් පිදුම් කිරීම බෞද්ධයන්ගේ සිරිත වේ. දරුවකු මව් කුස පිළිසිඳ ගත් දා සිට වැඩි වියට පැමිණ මිය යාම දක්වා ජීවිතයේ සෑම කටයුත්තක් ම බෞද්ධ සංස්කෘතිය හා බැඳී පවතියි.

බෞද්ධයන්හට ඉතා වැදගත් ආගමික උත්සව තුනක් පහත දැක්වේ.

- වෙසක් උත්සවය
- පොසොන් උත්සවය
- ඇසළ උත්සවය

බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය, බුදුවීම සහ පිරිනිවීම යන අවස්ථා තුන සිහි කිරීම වෙනුවෙන් වෙසක් උත්සවය බෞද්ධයන්ට අතිශය වැදගත් ය.

ලංකාවට බුදු දහම රැගෙන මිහිඳු හිමියන් ප්‍රමුඛ ධර්ම දූතයාණන් වහන්සේලාගේ පැමිණීම පොසොන් පුන් පොහොය දිනක සිදු වූ බව විශ්වාස කෙරේ. එම නිසා පොසොන් උත්සවය බෞද්ධයන් විසින් මහත් උත්කර්ෂවත් ලෙස සමරනු ලැබේ.

සිදුහත් බෝසතාණන් බුද්ධත්වයට පත්ව පළමු ධර්ම දේශනාව පැවැත්වීම ඇසළ පුන් පොහෝ දිනක සිදුව ඇති බව බෞද්ධ පිළිගැනීමයි. එම නිසා ඇසළ පොහොය බෞද්ධයන් විසින් තම ආගමික උත්සව අතර ප්‍රමුඛත්වයෙහි ලා සලකනු ලැබේ.

ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්ට මුල්තැන දෙමින් පෙහෙවස් සමාදන් වීම, ගිලානෝපස්ථානය, ධර්ම දේශනා පැවැත්වීම, දන්සල් දීම, තොරණ ඉදි කිරීම ආදිය මෙම ආගමික උත්සව සමග සුලභව දැකිය හැකි ය. ඊට අමතරව සෑම මසක ම පුර පසළොස්වක පොහොය දිනවල ශීල, භාවනා වැඩසටහන් පැවැත්වීම හා වෙනත් පිංකම් සංවිධානය කිරීම සිදු වේ.

කෙනෙකුට ආශීර්වාද කිරීමක දී මෙන් ම සුබ පැතීමේ දී ද "බුදු සරණයි" "තෙරුවන් සරණයි" වැනි ආමන්ත්‍රණ වර්තමාන සමාජයේ බහුලව යොදා ගන්නවා ඔබ කොතෙකුත් අසා ඇත. එය බෞද්ධ සංස්කෘතිය අගයන පුද්ගලයෙකුගේ ස්වභාවය පෙන්නුම් කරන කදිම ලක්ෂණයකි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## හින්දු සංස්කෘතිය (Hindu Culture)

හින්දු ආගමික දෙමළ ජනතාව හින්දු සංස්කෘතියට අනුව ආගමික චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරති.

හින්දු භක්තිකයෝ ශිව, විෂ්ණු, ස්කන්ධ, ගනේෂ, කාලි වැනි දෙවියන් උදෙසා පුද පූජා පවත්වති. ඔවුන් දෛනික කටයුතු ආරම්භ කරන්නේ ද දෙවියන් නැමදීමෙන් අනතුරුව ය.

හින්දු ආගම හා බැඳුණු ප්‍රධාන සංස්කෘතික උත්සව කිහිපයක් පහත දැක්වේ.

- තෛපොංගල් උත්සවය
- දීපාවලි උත්සවය
- මහාශිව රාත්‍රී උත්සවය





තෛපොංගල්, දීපාවලි උත්සව

අප රටේ හින්දු භක්තියකයෝ තම ජීවිතයේ විවිධ අවස්ථාවල හින්දු ආගමික චාරිත්‍ර ඉටු කරති. දරුවකු මව් කුස පිළිසිඳ ගැනීමේ සිට ඉපදීම දක්වාත් ඉන් අනතුරුව නම් තැබීම වැනි අවස්ථාවල දීත් හින්දු සංස්කෘතියට අදාළ චාරිත්‍ර අනුගමනය කරනු ලැබේ. ආවාහ විවාහ අවස්ථාවල දී මෙන් ම මරණයට පත් වූ විට ද හින්දු චාරිත්‍ර හින්දු සංස්කෘතිය මුල් කර ගෙන සිදු වේ.

## ක්‍රිස්තියානි/කතෝලික සංස්කෘතිය (Christian/ Catholic Culture)

ක්‍රිස්තියානි/කතෝලික භක්තිකයන් විසින් ප්‍රධාන ආගමික උත්සව දෙකක් පවත්වනු ලැබේ.

- නත්තල් උත්සවය
- පාස්කු උත්සවය

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සැමරීම සඳහා සැම වසරක ම දෙසැම්බර් 25 වෙනිදා නත්තල් උත්සවය පව ත්වනු ලැබේ.

ජේසු සමිඳාණන් කුරුසයේ ඇණ ගැසීම සිහි කිරීම සඳහා මහ සිකුරාදාත්, නැවත උත්ථානය වීම සැමරීම සඳහා පාස්කු උත්සවයත් පවත්වනු ලැබේ.





නත්තල් උත්සවය

සෑම කිතුනුවකු ම තම දරුවා බෞතීස්ම කොට දෙවියන් වහන්සේගේ දරුවකු බවට පත් කිරීම වැදගත් ආගමික චාරිත්‍රයකි. විවාහ ගිවිස ගැනීම, විවාහ මංගල උත්සව පැවැත්වීම වැනි ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවක් ම පල්ලිය ආශ්‍රිතව සිදු කරනු ලැබේ. කිතුනුවකු මිය ගිය විට ඔහුගේ ආත්මය වෙනුවෙන් යාච්ඤා කිරීම, භූමදානය කිරීම වැනි දෑ සිදු වන්නේ ද කතෝලික/ ක්‍රිස්තියානි සංස්කෘතිය ඇසුරු කර ගෙනයි.

එසේ ම සෑම දිනක ම, සෑම වැදගත් කාර්යක දී ම දෙවියන් වහන්සේ සිහි කිරීම සෑම කිතුනුවකුගේ ම පුරුද්දකි.


## ඉස්ලාම් සංස්කෘතිය (Islamic Culture)

ඉස්ලාම් බැතිමතුන් විසින් ප්‍රධාන සංස්කෘතික උත්සව තුනක් පවත්වනු ලැබේ.

- මිලාදුන් නබි උත්සවය
- රාමසාන් උත්සවය
- හජ්ජි උත්සවය

මහම්මත් නබි තුමාගේ උපන් දිනය සිහි කරමින් දුගී මගී යාචකයන්ට දන් දීම මිලාදුන් නබි උත්සවයේ ප්‍රධාන තැනක් ගනියි. දින 30ක කාලයක් හිරු නැගෙන මොහොතේ සිට හිරු බැස යන තෙක් ආහාර අනුභවයකින් තොරව උපවාස කිරීම රාමසාන් උත්සවය හා බැඳුණු චාරිත්‍රයකි. එම උපවාසය අවසන් කර රාමසාන් උත්සවය පවත්වනු ලැබේ.





**රාමසාන්, හජ්ජි උත්සව**

මුස්ලිම් ජනතාවගේ ශුද්ධ භූමිය ලෙස සලකනු ලබන මක්කම වන්දනා සමය සැමරීම සඳහා හජ් උත්සවය පවත්වනු ලැබේ. හජ් වන්දනාව සඳහා බොහෝ පිරිසක් අප රටෙන් ද මක්කම බලා පිටත්ව යති. එසේ නොයන මුස්ලිම් බැතිමත්හු තම ප්‍රදේශයේ මස්ජිදයට ගොස් යාච්ඤාවන්හි නිරත වෙති.

තම ජීවිතයේ සෑම අවස්ථාවක ම ඉස්ලාම් සංස්කෘතිය හා බැඳුණු සිරිත්විරිත් අනුව කටයුතු කිරීමට මුස්ලිම් ජනයා පෙළඹී ඇත. එය දරුවකු මව් කුස පිළිසිඳ ගැනීමෙන් ආරම්භ වී මිය යාමෙන් අනතුරුව දක්වා වූ කාල පරාසයකට අයත් ය. දරු උපතක දී මෙන් ම විවාහ උත්සව හා අවමංගල අවස්ථාවල දී අනුගමනය කරන චාරිත්‍ර මීට නිදසුන් වේ.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 3.3 ක්‍රියාකාරකම

- ඔබ ප්‍රදේශයේ හෝ වෙනත් ස්ථානයක වෙනත් ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායමක සංස්කෘතික ස්ථානයක් නැරඹීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යාපන චාරිකාවක් සූදානම් කරන්න. මේ සඳහා විෂයභාර ගුරුතුමාගේ/ ගුරුතුමියගේ උපදෙස් හා මඟ පෙන්වීම ලබා ගන්න. පහත දැක්වෙන කාර්ය පත්‍රිකාව ඒ සඳහා උපයෝගී කර ගන්න. (උදා:- මහනුවර දළදා මාලිගය/ මඩු පල්ලිය/ නල්ලූර් කෝවිල/ මෝදර රතු පල්ලිය වැනි තමන්ට වඩාත් පහසු සහ ආසන්න ස්ථානයක්)
- චාරිකාව යන ස්ථානය/ ස්ථාන
- චාරිකාවේ අරමුණු
- එහි දී නරඹන ලද දේවල්
- වෙනත් සංස්කෘතික අංග
- එම සංස්කෘතික අංග නැරඹීම හා අදහස් හුවමාරුව මගින් ඔබ ලද අත්දැකීම්

## බහු සංස්කෘතීන් පවතින වෙනත් රටවල්

ලොව බොහෝ රටවල් බහු සංස්කෘතික සමාජ වන බව ඔබ දන්නෙහිය. ඒ අතරින් ඉන්දියාව හා ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල් දෙකෙහි පවතින බහු සංස්කෘතික ස්වභාවය පිළිබඳව සාකච්ඡා කරමු.

## ඉන්දියාව (India)


ලොව දක්නට ලැබෙන ප්‍රබලතම බහු සංස්කෘතික සමාජයක් සහිත රටවල් අතරින් ඉන්දියාව සුවිශේෂ වේ. ඈත අතීතයේ සිට බහු සංස්කෘතික රටක් ලෙස ඉන්දියානු ජනතාව සහයෝගයෙන් ක්‍රියා කිරීම සුවිශේෂ තත්ත්වයකි.

පහත දැක්වෙන්නේ ජනවර්ග, භාෂා හා ආගම් පිළිබඳව පන්තියේ සිසුන් විසින් රැස් කරන ලද තොරතුරු කිහිපයකි. එමගින් ඉන්දියාවේ බහු සංස්කෘතික ස්වභාවය හඳුනාගත හැකිය.

| ජනවර්ග | භාෂා | ආගම් |
|---|---|---|
| දෙමළ, උර්දු, බෙංගාලි, මුස්ලිම්, බන්ජාරා, චක්මා, මරාති, මුන්ඩා | හින්දි, උර්දු, දෙමළ, ඉංග්‍රීසි, මරාටි, මලයාලම්, පංජාබි, තෙලිගු, ගුජරාටි, කන්නඩා, සංස්කෘත | හින්දු, කතෝලික, ඉස්ලාම්, බෞද්ධ, ශිව |

බහු සංස්කෘතික රටක් වශයෙන් ඉන්දියාව කටයුතු කිරීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

- සෑම වාර්ගික, ආගමික හා භාෂා කතා කරන කණ්ඩායමක් ම සමානාත්මතාවෙන් යුතුව සැලකීම
- රාජ්‍ය භාෂා ලෙස හින්දි හා ඉංග්‍රීසි භාෂා භාවිත කිරීම (තමිල්නාඩු ප්‍රාන්තය රාජ්‍ය භාෂාව ලෙස හින්දි භාෂාව නොපිළිගනියි.)
- සෑම පුරවැසියකු ම රාජ්‍ය භාෂාවලට අමතරව වෙනත් භාෂාවක් දැන සිටීම
- තම ආගම ඇදහීමේ නිදහස සහ අයිතිය ආරක්ෂා කිරීමට පියවර ගැනීම




ජනවාර්ගික කණ්ඩායම් විශාල ප්‍රමාණයක් මෙන් ම ආගමික හා භාෂා කණ්ඩායම් රාශියක් ද පැවතීම මගින් ඉන්දියාව වර්තමානයේ බොහෝ ඉදිරියට පැමිණ ඇත. සියලු පුරවැසියන් වාර්ගික, ආගමික, භාෂා භේද පසෙක දමා තම රට ගැන සිතා ක්‍රියා කිරීම නිසා "ඉන්දියානුවා" යන හැඟීම වර්ධනය වී තිබේ. එය, ඉන්දියාවට ලෝක බලවතෙකු ලෙස නැගී සිටීමට උපකාරී වී ඇත.

## ඇමෙරිකා එක්සත් ජනපදය (The United States of America)

ඇමෙරිකා එක්සත් ජනපදය තුළ විවිධ වාර්ගික, විවිධ භාෂා හා විවිධ ආගමික කණ්ඩායම් විශාල සංඛ්‍යාවක් ජීවත් වේ. ලොව විවිධ රටවලින් සංක්‍රමණය වූ පිරිස් පැමිණ ජීවත් වීම නිසා එහි බහු සංස්කෘතික සමාජයක් ගොඩනැගී ඇත. බහු සංස්කෘතික රටක් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය සාමූහිකව සහ සහයෝගයෙන් කටයුතු කිරීම නිසා වර්තමානයේ ලොව ප්‍රබලතම රාජ්‍යයන්ගෙන් එකක් බවට එය පත්ව ඇත.




පහත දැක්වෙන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ බහු සංස්කෘතික ස්වභාවය පෙන්නුම් කරන තොරතුරු කිහිපයකි. එය හොඳින් අධ්‍යයනය කරන්න.

| ජනවර්ග | භාෂා | ආගම් |
|---|---|---|
| සුදු ජාතීන්, කළු ජාතීන්, ආසියානු ජාතීන්, රතු ඉන්දියානුවන්, ඇලස්කානුවන්, හවායියන් සහ පැසිපික් කලාපීය ජන කොටස් | ඉංග්‍රීසි, ස්පාඤ්ඤ, සැමෝන්, කැමරු, කැරෝකි, හවායියන්, චීන, වියට්නාම, කොරියන්, ජර්මන්, ප්‍රංශ, රුසියන්, ඉතාලි | ප්‍රොතෙස්තන්ත්‍ර රෙපරමාදු, රෝමානු කතෝලික, වෙනත් ක්‍රිස්තියානි, මුස්ලිම්, බෞද්ධ, ජුදා |

මූලාශ්‍රය : www.indexmundi.com

බහු සංස්කෘතික රටක් වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය කටයුතු කිරීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග

- ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනීම
- කිසිදු ආගමක් රාජ්‍ය ආගම ලෙස නොපිළිගැනීම
- සෑම පුරවැසියකුට ම සමාන අයිතිවාසිකම් හිමි වීම
- ප්‍රජාතන්ත්‍රවාදය පිළිගැනීම හා ඊට අනුකූලව ක්‍රියා කිරීම

## සංස්කෘතික අනන්‍යතාව (Cultural Identity)

සෑම ජන වර්ගයකට ම, ආගමික කණ්ඩායමකට ම සහ භාෂා කතා කරන කණ්ඩායමකට ම තමන්ට සුවිශේෂ සංස්කෘතියක් ඇත. එක් සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් වෙන් කර හඳුනා ගත හැකි වන්නේ සංස්කෘතික අනන්‍යතාව තුළිනි. සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට සෑම කණ්ඩායමක් ම උත්සාහ දරති.

උදා : ශ්‍රී ලාංකික සංස්කෘතික අනන්‍යතාව

අප සියලු දෙනාට ම සුවිශේෂ වූ සංස්කෘතියක් ඇත. එය සංස්කෘතික අනන්‍යතාවයි. එම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කිරීම අප සැමගේ යුතුකමකි. සිංහල, දෙමළ, මුස්ලිම් සෑම ජනවර්ගයකට ම උරුම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම නිදසුන් වේ. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික/ ක්‍රිස්තියානි සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම තවත් නිදසුනකි. තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම සංස්කෘතිය පවරාදීමට හේතු වේ. තමන්ට ප්‍රෞඪ සංස්කෘතියක් උරුම වන්නේ සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම හේතුවෙනි.

## සංස්කෘතික අනන්‍යතාව හා ජාතික සමගිය

තමන්ට සුවිශේෂ වූ සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කිරීමට සෑම වාර්ගික, ආගමික කණ්ඩායමක් ම යොමු වේ. ඒ සමඟ ම අනෙක් සංස්කෘතීන්ට ගරු කිරීමටත්, ඒවායේ සංස්කෘතික අංග ආරක්ෂා කිරීමටත් ක්‍රියා කළ යුතු ය. එවිට ජාතික සමගිය ආරක්ෂා වේ. රටක ජාතික අභිවෘද්ධිය ඇති වන්නේ සෑම සංස්කෘතික කණ්ඩායමක් ම

තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් එක්සත්ව කටයුතු කළහොත් පමණි. රටක සියලු සංස්කෘතීන්ගේ එකතුව එම රටේ ජාතික සංස්කෘතියයි. එම ජාතික සංස්කෘතිය පෝෂණය කිරීම සියලු දෙනාගේ ම වගකීමක් හා යුතුකමක් වේ. එය ජාතික සමගියට මාවතයි.

"එක මවකගෙ දරු කැල බැවිනා යමු යමු වී නොපමා"

යනුවෙන් අපේ ජාතික ගීයෙන් අර්ථවත් වන්නේ ද එම අවශ්‍යතාවයි.

බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකු ලෙස කටයුතු කිරීමේ දී අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම අතිශය වැදගත් වේ. තම සංස්කෘතියට මෙන් ම අනෙක් සංස්කෘතීන්ට ගරු කිරීම, ඔවුන්ගේ අනන්‍යතාවට හානියක් නොකිරීම අපේ යුතුකමකි. එවිට ජනවර්ග අතර විශ්වාසය ගොඩනැගෙයි; ජාතික සමගිය ආරක්ෂා වේ; තිරසර සාමයක් ගොඩ නැගෙයි.

## තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමේ වැදගත්කම



තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් කටයුතු කිරීමෙන් සුහදතාව වර්ධනය වේ. එක් වාර්ගික හෝ ආගමික හෝ කණ්ඩායමක් වෙනත් එවැනි කණ්ඩායමක් දෙස සැකයෙන් නොබලති. ඔවුනොවුන් අතර සුහදතාව, විශ්වාසය, සංහිඳියාව ගොඩනැගෙයි. රටක ඉදිරි සංවර්ධනය රඳා පවතින්නේ එම රටේ සියලු පුරවැසියන් එක්සත්ව, එක්සිත්ව ක්‍රියා කළහොත් පමණි. පටු වාර්ගික, ආගමික, භාෂාමය භේද පසෙක දමා ජාතික හැඟීමෙන් යුතුව ක්‍රියා කිරීමට කුඩා කල සිට ම ඔබ අදිටන් කර ගත යුතු ය. මෙම විෂයයේ මුඛ්‍ය අරමුණ වන්නේ එයයි.

### ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමේ වාසි



- එකිනෙකා අතර අවබෝධය ඇති වී විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම නිසා ගැටුම් අවම වේ.
- ජන කොටස් අතර සමගිය තහවුරු වේ.
- රට සංවර්ධනය කිරීම සඳහා සියලු දෙනාගේ දායකත්වය ලැබේ.
- එකමුතුව හා සාමූහිකව කටයුතු කිරීමට පෙළඹීමක් ඇති වේ.
- ඵලදායී ආර්ථික කටයුතුවල යෙදෙමින් රට සංවර්ධනය කිරීමට දායක වේ.
- සංස්කෘතික විවිධත්වයට ගරු කිරීමට හා එකිනෙකාගේ යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට පෙළඹෙයි.

### 3.4 ක්‍රියාකාරකම

- "සංස්කෘතිය රැක ගැනීමේ වැදගත්කම" මැයෙන් බිත්ති පුවත්පත සඳහා ලිපියක් ලියා එය එහි පළ කරන්න.
- "ජාතික සමගියේ වැදගත්කම" මැයෙන් රචනාවක් ලියන්න. සියලු සිසුන්ගේ රචනා රැස් කර අඩුපාඩු සකස් කරවා පොතක් වශයෙන් එළිදක්වන්න. එය පාසල් පුස්තකාලය සඳහා පරිත්‍යාග කරන්න.

## සාරාංශය

- සමාජයක් මෙහෙයවන ප්‍රධාන බලවේගය සංස්කෘතියයි.
- විවිධ සංස්කෘතික ලක්ෂණවලින් හෙබි සමාජ බහු සංස්කෘතික සමාජ වේ.
- ලෝකයේ බොහෝ රටවල බහු සංස්කෘතික සමාජ දැකිය හැකි ය.
- බහු සංස්කෘතික සමාජයක විවිධ ජනවර්ග, විවිධ ආගම් අදහන ජන කොටස්, විවිධ භාෂා කතා කරන ජන කොටස් ජීවත් වෙති.
- එසේ ම එවැනි සමාජයක විවිධ සිරිත්විරිත්, විවිධ සංස්කෘතික උරුම දක්නට ලැබේ.
- බහු සංස්කෘතික සමාජයක ජීවත් වීමේ දී සියලු දෙනා ම තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීම ඉතා ම වැදගත් වේ.